


තල්, පොල් සහ මුතු පබා - 16

# බ්‍රිතාන්‍ය සංචාරකයා කුතුහලයට පත් කළ ආදම් ගේ කන්ද - 3

ශ්‍රියා කුමාරසිංහ - නවසීලන්තයේ සිට




**1295 දී** සමනල කන්ද ගැන සඳහනක් කරමින් මාර්කෝ පෝලෝ මෙසේ කියා සිටී. මේ දූපතේ අසාමාන්‍ය උසකින් යුත් කන්දක් තිබේ. කිසිවෙකුට හෝ තරණය කල නොහැකි අන්දමේ එක එල්ලේ ඉහලට නගින ස්වභාවයේ නැග්මක් සහිත එම කන්දේ ප්‍රපාතය ඉතා ගැඹුරුය. එහි සවි කොට තිබෙන ශක්තිමත් විශාල යකඩ දම්වැල් කිහිපය නොතිබෙන්නට මිනිසුන්ගේ ආධාරයෙන් පමණක් එහි නැගීම ඉතා අසීරු කාර්යයකි.

මෙම කන්දේ අපේ ආදි පීතෘවරයාණන් වන ආදම්ගේ සොහොන ඇතැයි ඔවුහු කියති. අඩු තරමින් මුස්ලිම් භක්තිකයින් ගේ විශ්වාසය එයයි. නමුත් පිළිම වන්දනා කරන්නන් කියා සිටිනුයේ එය ශාක්‍ය මුනිඳුන්ගේ සොහොන බවයි. ඔහුට පෙර සිටියායයි කිවහැකි කිසිම ශාස්තෘවරයෙකුගේ පිළිමයක් නොමැති බැවිනි. ශාක්‍ය මුනිඳුන්ගේ පිය රජතුමා විසින් ඔහුගේ හැඩරුවට රන් පිළිමයක් සෑදූ ආකාරය විස්තර කරන මාර්කෝ පෝලෝ මෙසේද කියයි. පිළිම වන්දනාවේ ආරම්භය එතැන් සිටයි. ඊට පෙර එවැනි කෙනෙක් සිටියේ නැහැ. ශාක්‍ය මුන-වරයා විශාල කැප කිරීමක් කරමින් බොහෝ දුරක් ගෙවා ගෙන මෙතැනට වන්දනාවේ පැමිණියා. හරියට ගැලීෂාවේ ශාන්ත ජේම්ස් දේවස්ථානයට යන කිතුනුවෙක් වගේ. මා මේ ඔබට කියන කතාන්තරයට අනුව ඔවුන්

*<u>මේ වීර ක්‍රියාව ඇසීමත් සමග අපගේ මනසට නැගෙන්නේ තෝමස් හුඩ් ගේ කතාන්තරයේ එන යෝධයා බොල්ස්ටර් ය. ඔහුද එක කඳු මුදුනක සිට තවත් කඳු මුදුනකට මෙවැනිම පියවරක් තැබූ නමුත් වාසනාවකට මෙන් ඉන් දැඩි හානියක් නොවිණි.</u>*

කියන්නේ කඳු මුදුනේ තිබෙන ස්මාරකය ඉහත කී රජුගේ පුතණුවන්ගේ බවයි. ඔහුට අයත් දත්, හිසකෙස් හා පාත්‍රයක්ද ඇති බව කියනවා. මුස්ලිම් වරුන් කියන්නේ ඒවා අයිති ආදම්ට කියලයි. ඇත්තටම ඒවා අයිති කාටද කියල දෙයියො තමයි දන්නෙ. ඒ කෙසේ වෙතත් ශුද්ධ වූ බයිබලයට අනුව ආදම්ගේ සොහොන තිබෙන්නේ ලෝකයේ ඒ දිශාවේ නොවෙයි. දැනට මෙහි තිබෙන මතයට අනුව, ආදම්ගේ සොහොනත්, ඔහුගේ හිසකෙස් සහ දත්ද, ආහාර ගැනීමට පාවිච්චි කල බඳුනත් ඒ කඳු මුදුනේ ඇති බව (කුබ්ලයි) ඛාන් ට දැන ගන්නට ලැබී තිබෙනවා. කෙසේ හෝ ඒවා තමාට අයත් කර ගැනීමට සිතා ඔහු ඒ සඳහා විශාල දූත පිරිසක් ක්‍රිස්තු වර්ෂ 1284දී පිටත් කර යැව්වා. ඔවුන් මුහුදින් සහ ගොඩබිමින් මග ගෙවා සෙයිලාන් දූපතට පැමිණ රජතුමා බැහැ දුටුවා. කෙසේ හෝ රජතුමා එකඟ කරවා ගත් ඔවුන්ට දන්ත ධාතු දෙකක්ද, කේශ ධාතු ස්වල්පයක්ද, වියතාණන් පාවිච්චි කල පාත්‍රා ධාතුවද ලබා ගන්නට හැකිවුණා. එය කොල පැහැති ආග්නේය පාෂාණයෙන් කල ඉතා අලංකාරවත් එකක්. නියෝජිත පිරිස ඒවා රැගෙන නැවත සිය නායකයා වෙත ගිය විට සතුටින් උදම් වූ ඔහු සියළුම පූජකයින්ට හා අනෙකුත් රටවැසියන්ට ධාතු පෙරහැර එන පෙරමගට යන ලෙස කීවේලු. ඒ අනුව කම්බුලාවේ මුළු ජනගහනයම පෙර මගට ආ අතර පූජකවරු ධාතූන් වහන්සේලා පිළිගෙන අධිරාජයා වෙත ගෙන යන ලදුව ඛාන් අධිරාජයා ඒ සියල්ල ඉතා ගෞරවාන්විත ලෙස පිළිගෙන තිබෙනවා. දෙවන සියවස තරම් ඈත කාලයේදී චීනයේ සිට

ඉන්දියාවට යාත්‍රා කල වන්දනාකරුවන් අහස උසට නැගී සිටි තේජාන්විත කඳු මුදුන දෙස ගෞරව සම්ප්‍රයුක්තව බැලීමට පුරුදුව සිටියහ. 1685දී පෘතුගීසි ජාතික රිබෙයිරෝ මෙසේ කියා ඇත. මුහුදු නැවියන් පවසන පරිදි කන්ද මුහුදේ හා ගොඩබිමේ යොදුන් විස්සක් ඈතට පෙනේ. කන්දේ උස සැතපුම් දෙකකි.

පාවන්-කු යන නමින් හඳුන්වනු ලැබුවා යයි කියන ලෝකයේ පළමුවන මිනිසාගේ පූජනීය පා සළකුණ පිළිබඳ සටහනක් චීන ආගමික පොත්වල සඳහන් වේ. ඉතා පිරිසිදු ජලය ස්වල්පයක් එම පා සළකුණ එබී ඇති කුහරයේ නිරන්තරයෙන්ම රැඳී ඇති බවත් කිසි දිනෙක එය සිඳී නොයන බවත් කියැවේ.

බුදුන්ගේ පා සළකුණ හා කන්ද සම්බන්ධ කොට ඇති ජන ප්‍රවාද දෙස සංසන්දනාත්මකව බලද්දී ඒවා පොත්පත්වල ලියැවී ඇත්තේ මෑත කාලයේදී බව පෙනේ. පැරණි බෞද්ධාගමික පොත්පත්වල ඒ ගැන සඳහනක් නැත. ක්‍රිස්තු වර්ෂ 413දී ලංකාවට පැමිණ කලක් අනුරාධපුරයේ වාසය කල චීන සංචාරකයා වන පාහියන් ගේ සටහන් වල හැරුණු කොට ඊට ඉහත කිසිම තැනක පා සළකුණ පිළිබඳ තොරතුරක් ලියැවී තිබෙනු මට සොයා ගැනීමට නොහැකි විය. ඔහු මෙසේ ලියා තිබුණි. බුදුන් වහන්සේ සිය ප්‍රාතිහාර්ය බලයෙන් සිය එක් පා සළකුණක් රාජකීය නගරයේ උතුරු දිග ප්‍රදේශයේද අනෙක් පා සළකුණ කන්දක් මුදුනේද තබා ඇත. පාහියන් මෙම ශුද්ධ වූ කන්දට ගිය බවට සටහනක් තබා නොමැති හෙයින් ඒ වකවානුවේදී එය වර්තමානයේ තරම් සුප්‍රසිද්ධ තැනක් නොවුණා යයි සැලකිය හැකිය. නව වන සියවසේදී ශ්‍රීපාද කන්දට ගිය වන්දනා ගමනක් ගැන පිලිගත හැකි සාධක තිබේ. එමෙන්ම 1150දී පළවෙනි පරාක්‍රමබාහුද, ඊට අවුරුදු දෙසීයකට පසු තුන්වන පරාක්‍රමබාහුද එවැනිම චාරිකාවල යෙදුනු බවට සාක්ෂි ඇත.

බුදුවරු සිව් දෙනෙකු මෙම කන්දට වැඩිය බව කියති. පළමුවැන්නා ක්‍රි.පූ.3001දීද, දෙවැන්නා ක්‍රි.පූ. 2099දීද, තුන්වැන්නා ක්‍රි.පූ.1014දීද, සිව් වැන්නා එනම් ශාක්‍යමුනි හෙවත් ගෞතම බුදුන් ක්‍රි.පූ.577දීද වෙති. මින් ගෞතම බුදුන් එක් අවස්ථාවක සිය එක් පා සළකුණක් කඳු මුදුනේද අනෙක් පා සළකුණ ඉන්දියාවේ මදුරා පුර වෙරළේද තැබූ බව කියති. ඒ මොහොතේ ඇතිවූ දෙදරීම හේතු කොට ගෙන දිවයින ප්‍රධාන භූමියෙන් කැඩී වෙන්වී ගිය බවද කියති. මේ වීර ක්‍රියාව ඇසීමත් සමග අපගේ මනසට නැගෙන්නේ තෝමස් හුඩ් ගේ කතාන්තරයේ එන යෝධයා බොල්ස්ටර් ය. ඔහුද එක කඳු මුදුනක සිට තවත් කඳු මුදුනකට මෙවැනිම පියවරක් තැබූ නමුත් වාසනාවකට මෙන් ඉන් දැඩි හානියක් නොවිණි. බුදුන්ගේ ඉහත කී ප්‍රාතිහාර්යය ආශ්‍රිතව ක්‍රි.ව.400දී ලියා ඇති තවත් එක් කුතුහලය දනවන විස්තරයක් මෙහිදී ඉදිරිපත් කරමි.

නිවන් මග හෙළි කරගත් එක් බුදුවරයෙකු සිටී. ඔහුද අන් බුදුවරුන් මෙන් මෙලොවට පැමිණියාහු වෙති. ඔහු ජීවිතයේ ආහාරය, එනම් ධර්මය බෙදන්නහුය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇත්තාහුය. ඒ හා බැඳුණු සංඥා අසූ දෙකක් දරන්නහුය. ඔහුගේ ශරීරය වටා ගැඹුරට විහිදෙන ආලෝක කදම්බයකි. හිස් මුදුනෙන්ද ආලෝක ධාරා විහිදේ. ඔහු අතීත, වර්තමාන හා අනාගත යන තුන් ලොව දත් මාර්ගෝපදේශකයාය. ඔහු අසංඛෙය්‍ය කල්ප හතරක් මුළුල්ලේ උතුම් ගුණ ධර්ම තිහකට උපමා ලබනු වස් එම ගුණ දම් පිරුවාහුය. බුද්ධත්වය ලබනු සඳහා මාරයා සහ ඔහුගේ පිරිවර පැරද-වූවාහුය. එය සිදුවී ගතවූ අටවැනි වසරේදී ඔහු අහසට නැග, සිය ශරීරය වටා වර්ණ සයකින් යුත් ආලෝක ධාරා විහිදුවා, සමන්ත කූට පර්වත මුදුනෙහි එකසිය අටක් සුබ ලකුණු සහ මහා චක්‍ර ලක්ෂණ පෙන්නුම් කරන පරිදි සිය පා සළකුණ සටහන් කරන ලද්දාහුය. එය

*<u>මේ අතර කිතුනුවන්ද මෙය ඔවුන්ගේ අධ්‍යාත්මික පියා වන සාන්ත තෝමස්ගේ යයි නැතහොත් බයිබලයේ එන පරිදි ඉතියෝපියානු කැන්ඩාස් රැජින යටතේ සිටි බලසම්පන්න සේ-වකයාගේ යයි කියමින් ඉතා රළු ලෙස දබරයට පැටළුණහ. එම ඉතියෝපියා-නු මහා පුරුෂයාට මේ කන්ද මුදුනේ තිබුණු රාජකාරිය කුමක්ද යන්න ගැන මාතුල පැහැදිලි අදහසක් නැත.</u>*

කුමන ආකාරයේ පර්වතයක්ද යනු, මනහර ආභරණ පැළඳි කන්‍යාවියක සේ සැලකිය හැකි සෑම වර්ගයකම අගනා මැණික් වලින් ගහණ කන්‍යා දිවයිනේ ඔටුන්න වැනිය. එහි සිට ගලන ගංගාවන් නිරන්තරයෙන් සිසිල් හා පිරිසිදු දිය දහරාවලින් පිරී ඉතිරී පවත්නේය. නිරන්තරයෙන් ඒ අවට පරිසරය මලින් බරවී, ඒවායින් පිටවන පරාග මුසුවී හමන වාතය සුවඳවත් වී පවත්නේය.

මෙයට අමතරව තවත් බොහෝ සිහිවටන සමනල කන්ද හා ඈඳී පවතී. එය

